සුදු කලු බණ

කතාබහට මේ කතාව ලියන්න කියල ලියල එවල තිබුණෙ සමීර (වාසගමයි පළාතයි මම ලියන්නෙ නැත්තෙ ඕනෙ-කමින්) සමීරගෙ වචන වලින්ම කතාව මෙහෙමයි. කියවලා ඔබම තීරණයකට එන්න.

මගේ යාලුවෙකුගෙ ගෙදර තිබුණ බණකට මම ගියේ මගේ බිරිඳත් දුවත් එක්කයි. මගේ දරුවන් බණ දහමට පුංචි කාලෙ ඉඳලම යොමු කරන්න මම උත්සාහ කරනවා.

එදා හාමුදුරුවො කිව්වෙ මාර බණක්.

ගිය ආත්මෙ පව් කළාම මේ ආත්මෙ දුප්පත් වෙලා උපදිනවා. ගිය ආත්මෙ කළ පව් අනුව තමයි මේ ආත්මෙ මේ දෙවල් ලැබිලා තියෙන්නෙ.. දන් බලන්න පින්වතුනි.. සල්ලි නැති හැමෝම හිතන්න අනේ මටත් සල්ලි තිබුණනම් කියලයිනෙ.. ගෙයක් නැති කෙනෙක් හිතන්නෙ අනේ මටත් ගෙයක් තිබ්බනම් කියලනෙ.. පොඩි ගෙයක් තියෙන කෙනෙක් හිතන්නෙ අනේ මට ලොකු ගෙයක් තිබුණ නම් කියලයි.. කලු කෙනෙක් නම් හිතන්නෙ අනේ මාත් සුදු වුනා නම් කියලනෙ..

මට දුව දිහා බැලුණා. අනේ ඒ දරුවගෙ මූණ මැළවිලා තිබුණ හැටි.

"ස්ටුපිඩ් ශ්‍රී ලංකන්ස්.." ආපහු එන අතරෙ දුව කියනවා ".. ඒ අය හිතන්නෙ සුදු අය විතරයි ලස්සන කියලා.. ඒ මදිවට දන් හාමුදුරුවොත් ඒකම කියනවා.. මං ආයෙ බණ අහන්න එන්නෙ නෑ තාත්තා.."

එයාට දෙන්න උත්තරයක් මට හිතාගන්න බැරිවුණා. මේ හාමුදුරුවරු කියන බණ අහන-කොට සුදු නොවන හමක් තියෙන දරුවන්ට මොනවා හිතෙනවා ඇද්ද? කලු වෙලා ඉන්නෙ ගිය ආත්මෙ කරපු පව් නිසයි කියලා කියනකොට මේ දරුවන්ට මොනා නොහිතෙනවා ඇද්ද?

මිනිස්සු කලු වෙන්නෙ ගිය ආත්මෙ පව් කරපු නිසා කියන එකයි කලු මිනිස්සු තමන් කලු වීම ගැන කණගාටුවෙන් ඉන්නවා කියන එකයි ඒ අය සුදු වෙන්න බලාගෙන ඉන්නවා කියන එකයි තමන්ගෙ බණට කියන හාමුදුරු-වරුන්ගෙ දැනීම සහ අවබෝධය ගැන මට කණගාටුයි. වෙන මොනවා කියන්නද?

මට තියෙන්නෙ පොඩි ගෙයක්. ඒත් කවමදාවත් මට ලොකු ගෙයකට යන ආසා-වක් ඇති වුණේ නැහැ. මම කලු මනුස් සයෙක්. ඒත් කවදාවත් මට ඒක අඩුවක් විදිහට දැනුණෙ නැහැ. සුදු වෙන්න තිබුණා නම් කියලා හිතුණෙත් නැහැ. තියෙන දෙයින් සතුටින් ඉන්න අපි වගේ මිනිස්සු ගැන අර හාමුදුරුවො දන්නෙ නැතිව ඇති.

සමීරගෙ ලිපිය ගැන මම කිසිම අදයක් ලියන්නෙ නැහැ. ඔබම විනිශ්චයකරන්න.

කතාබහ
ජගත් ජේ එදිරිසිංහ

හිතන්න යමක්

ඔබට ඊර්ෂ්‍යාකරන මිනිසුන්ට වෛර නොකරන්න.

ඔවුන්ට ගරු කරන්න.

මන්ද, ඔබ ඔවුන්ට වඩා දක්ෂ බව තේරුම් ගත් මිනිස්සු ඔවුහුය.

මෝදි මෝඩි කිරීම

ඉන්දියාවේ අගමැතිගේ වාසගම මෝදි. ඒත් අපේ මාධ්‍ය ඔහුව හඳුන්වන්නෙ මෝඩි නමින්. ඒ විතරක් නෙවෙයි. ඇත්තටම ඔහුගෙ නම මෝඩි කියලා හිතලා ඒ නමට උපහාස කරලා කාටුන් නම් කොයි තරම් ඇත්ද?

අපේ මාධ්‍ය මේ විදිහට නම් වරදිද්දත්තෙ ඉංගිරිසි මාධ්‍ය වල පළවන ඒවා කෙළින්ම පිළිගැනීම නිසයි. නොදැනුවත්කමට වන වැරදි ඉවසන්න පුලුවන්. ඒත් දැන දැනම කරන වැරදි වලට නම් සමාව දෙන්න බැහැ.

කලු සුද්දන් වෙන්නට තනනන අපේ සමහර අය ඕනෑකමින්ම නම් වරදිද්දන හැටි අපි දකිනවා. සමහර ක්‍රිකට් තිවේදකයන් ලසිත් මාලිංග හඳුන්වන්නෙ මලිංගා කියලා. උපුල් තරංග ඒ අයට තරංගා ය. ඉන්දිය ක්‍රිකට් ක්‍රීඩක ගාම්භීර් ගෙ නම කියාගන්න බැරිව සුද්දන් "ගැම්බියා" කියද්දි අපේ කලු සුද්දනුත් " ගැම්බියා" කියනු අපි අහලා තියෙනවා. (ඒ අතින් රසල් ආනල්ඩ් විශිෂ්ටයි. ඔහු කලු සුද්දෙක් නොවී ඉංග්‍රිසි කතා කරන හැටි අපූරුයි.)

"බුද්ධ" කියන වචනය කියාගන්න බැරි සුද්දන් බුදු හාමුදුරුවන් හඳුන්වන්න "බුද්ධා" නැත්නම් "බුඩා" කියල. අපේ කලු සුද්දනුත් "බුද්ධා" ලෙසත් "බුඩා" ලෙසත් බුදුහාමුදුරුවන් හඳුන්වනු ඔබත් අසා ඇති.

සුද්දන්ගෙ දිව උලුක්වෙයි කියලා දුකට තම තමන්ගෙ නම් වෙනස් කරගන්න අය ගැන කියන්න තියෙන්නෙත් මේ ටිකම තමයි

මෙහෙම වෙන්නෙ අපේ මිනිස්සුන්ගෙ හීනමානය නිසාද?

පුංචි හපන්නු

සැප්තැම්බර් 21 දා සෙන්ට් ඕල්බන්ස් සිංහල පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය බලන්න ගිය වෙලාවෙ හිතට ආව අදහස් කීපයක් ලියා තබන්න හිතුවා. ප්‍රසංගයේ විවිධ අංග ඉදිරිපත් කළ දරු දැරියන් ගැනත් ඒ පි-ටුපස සිටි ගුරුවරුන් හා දෙමාපියන් ගැනත් අපේ සිතේ තියෙන්නෙ විශාල ප්‍රශංසාවක්. පසුගිය හැම වසරකටමත් වඩා මෙවර ප්‍රසංගය සාර්ථකයි.

ප්‍රසංගය ආරම්භ කරමින් අපේ හිතවත් හැපි පෙරේරා ඉදිරිපත් කළ අදහසක් ඉතා වැදගත්. " මෙවන් ප්‍රසංග ඉදිරිපත් කිරීමෙන් අපි බලා පොරොත්තුවෙන්නෙ අපේ දරුවන් සිංහල භාෂාවට නුරු කිරීම පමණක්ම නෙවෙයි. අපේ දරුවන් අපේ සංස්කෘතිය කෙරෙහි අපේ සංස්කෘතිකාංග කෙරෙහි නුරු කරවීමකුත් අපි බලාපොරොත්තු වෙනවා" ඔහු කිව්වා. මේක ඉතාමත්ම වැදගත් අදහසක්. ලෝකයේ කොයි දේසෙක හිටියත් අපේ කම යන්න අපේ දරු-වන්ගෙ හිත්වලින් ඈත් වෙන්න දෙන්න හරකයි.

කොල කෑල්ලකින් ඔසියන් බවට පත් වුණාත් අපව කවදාවත් ඔසියන් ලෙස පිළිගැනෙන්නෙ නැහැ කියන සත්‍යය අපි තේරුම් ගත යුතුයි. අපි අපේ අනන්‍යතාවත් අමතක කර ගත්තොත් අන්තිමේ අපි දෙපැත්තටම නැතිව අතරමං වෙච්ච මිනිස්සු ටිකක් වෙයි.

අපේ දරුවන් හරි දෙය වෙත යොමු කළ යුතුයි කියන කාරණය කතා කරද්දි මට මතක් වුණ දෙයක් තියෙනවා. පසුගිය මාසයේ පැවැත්වුණ සුදාර ද සිල්වා පුතාගෙ සිහල ගී ප්‍රසංගය අවසානයෙදි තමයි මම මේක නිරීක්ෂණය කළේ. ප්‍රසංගය අවසන් වන විට සංවිධායකයන් සෑම දරුවකුටම පුංචි තෑග්ගක් ප්‍රදානය කළා. ශ්‍රී ලංකා ජාතික ගීය ගැයුනෙ ඊට පස්

සෙයි. අර දරුවන් තමන් අත තිබුණ තෑගි බිම තියලා ජාතික ගීයට සීරුවන් හිටිය හැටි අපේ සතුටට හේතු වුණා. ඒක අපේ වැඩිහිටියන්ටත් ආදර්ශයක්.

මේ වගේ දසුනක් මම මුළින්ම දැක්කෙ මෙයට අවුරුදු දහයකට දොළහකට විතර කලින්. ඒ කාලෙ දන් තරම් සිංහල පාසල් පැතිරිලා තිබුණෙ නැහැ. මෙල්බන් නැගෙනහිර පැත්තට වෙන්න තියෙන සිංහල පාසලක වාර්ශික විවිධ ප්‍රසංගයේ ආරාධිත දේශණයකට මට සහභාගිවෙන්න වුණේ ඒ පාසලේ සංවිධායකව සිටි අභාවප්‍රාප්ත රමණි ලියනාරච්චි මහත්මියගේ ආරා-ධනයෙනුයි. එදා ඒ ප්‍රසංගයට පැමිණුන සියල්ලන් පිළිගත්තෙ අපේ ජාතික ඇඳුමින් සැරසී ප්‍රධාන දෙ-රටුව ඉදිරියේ සිටි මල් වැනි දරු දැරියන් පිරිසක්. ඔවුන් දෑත් එක්කර පැමිණෙමින් සිටි අමුත්තන් "ආ-යුබෝවන්" කියා පිළිගත් හැටි හැමෝගෙම ප්‍රසාදයට ලක්වුණා.

දරුවන් මල්ම තමයි. ඔවුන් තමයි මේ ලෝකය ගොඩ නගන්නෙ. ඒ දරුවන්ට නිසි මග පෙන්වීම දෙමාපියන්ගෙ වගකීමයි.

සෙන්ට් ඕල්බන්ස් සිංහල පාසලේ සියලුම ගුරු-වරියන්ටත් සංවිධායක මිල්කින් බණ්ඩාරනායකටත් අපේ කෘතවේදීත්වය නැවතත් පිරිනමන්න කැමතියි.

අන්දරේ

අන්දරේට රා බොන්නට සිත්විය. මොකක්දෝ හේතුවකට රා මදින්නා අන්දරේට රා දීම ප්‍රත්ක්ෂෙප කළේය. අන්දරේ රා මදින්නා රා ටිකක් නොදුන් පළියට මේ වස් කවිය කීවේය.

තියෙන තියෙන පය ලිස්සා	වැටියන්
බඳින බඳින හරෙ පොටවල්	කැඩියන්
කපන කපන මල රා ටික	සිඳියන්
මට රා නොදුන් තෝ ගහ මුල	වැටියන්

මෙය ඇසීමෙන් ඕයට පත් වූ රා මදින්නා ඔහුට රා මුට්ටියක් දෙයි. ඉන් සතුටට පත් අන්දරේ පහත් සඳහන් සෙත් කවිය කීවේලු.

කළුවන් කළු රුවයි අපෙ ගම	මදින්නා
මංඩි නැතිව රා සැමටම	බෙදන්නා
එන එන කැකුළු මල් තෙරපා	තලන්නා
දෙවියෝ රැක දෙවන් අපෙ ගම	මිදින්නා

අන්දරේ පොඩි පහේ මනමාලයෙකි. දිනක් ඈත ගමනක් යනවිට අන්දරේ වී වපුරන තරුණ කාන්තාවන් පිරිසක් දුටුවේය. මේ කවිය කීවේ ඔවුන්ටය.

මිට මිටේ වපුල වී කන්නේ	සේරු
පිට රටේ ඇවිත් මොටදැයි	කයිවාරු
කට වටේ මගෙ වැට බැන්දේ	කවුරු
පිට පටේ නැතුව වපුරුම නැත	සීරු

රාජාධිරාජසිංහ රජ තුමා

රාජාධිරාජසිංහ රජ තුමාගේ (ක්‍රි.ව. 1782 - 1798 පාලන සමය) ආචාර්යවරයන් වූ මොරගොට ධම්ම-ක්ඛන්ද ස්වාමීන් වහන්සේගේ සිල් විමසීමට රජ තුමා වරෙක ගැහැනියක තස් වෙස් වලාගෙන එතුමන්ගේ ආවාසගෙයි ජනේලයෙන් ඇතුළට අත දැම්මේය. අතෙහි වළලු තිබුණත් මේ රජුගේ අත බව හිමියෝ හඳුනාගත්හ. දක්ෂ කවියකු වූ අන්වහන්සේ එසැණින් මේ කව කීහ.

සකල මුවතඹර සියොගත	සියුමැලියේ
ඇසල මස දුටිමි යනවා	දෙවිකෙළියේ
අසල නම් නිතර දැකුමට	සිතුමැ ලියේ
මෙකල සිරිලකට අගරජ	නුඹඳ ලියේ..

හිමියන්ගේ සිල්වත් බව පිළිබඳ පැහැදුණ රජු මෙකවෙන් පිළිතුරු දුන්නේය.

අමර ගුරු හරණ සතඳත්	පිනාවන්
විතර නොවන ගුණ නැත	සපිරිනාවන්
පවර නමැති මොරතොට යති	මනාවන්
සසර වසන තුරු මට	වාසනාවන්.

රාජාධිරාජසිංහ රජ තුමා තවත් අවස්ථාවක කියූ කවක්

වත නම් ඉගට ඇඳලා සේලය	අයුරු
කත නම් මෙමට සොඳ බස් දෙන්නේ	මියුරු
දුටු නම් දනෝ මා හට නොකරති	අගරු
මට නම් ළඳේ හේලන් අඟවෙගි	පැදුරු

ඇහැළේපොළ කුමරිහාමි පිළිබඳව ලියැවුණ පැරණි කවි දෙකකි මේ

මහ ගඬඩාවේ සතර දෙනෙක් ඉඳ	
	කිරිපෙවේ මැණිකෙයි ඉල්ලන්නේ
දෙතන දෙකේ කිරි පොවලා හරියට	
	පව් අරවාලයි අර ගන්නේ
කුසයේ දන ගිණි ඇවිලෙනවා ඇයි	
	දෙවි මේ අවනඩු නොබලන්නේ
නෙතින් වෑහෙන කඳුළැල් වැගිරෙනවා	
	සත් පත්තිනි දෙවියන්නේ

මහ නිළමේ මට කල් බැදලා සිට වැදු	
	ඒ දරුවන් නොලැබෙච්චි
දෙවෙනුව වැදු මගෙ ඩිංගිරි මැණිකෙට	
	කිරි ටික බොන්නට බැරිවෙච්චි
අකාල කරුමෙට වදාපු දරුවන්	
	වනේ ලා කොටන්නට සිදුවෙච්චි
දෙමළ රජුට හෙනයක් දෙන්නට	
	සත් පත්තිනි දෙවි නැතිවෙච්චි

(1814 මැයි 16 හෝ 17 වෙනි දිනක සිදු වූ මෙම සිදුවීම පිළිබඳව ලියා ඇති විස්තරයකිනි.)